# පාස්කු ප්‍රහාරයෙන් අසරණවූ දරුවන් 33 දෙනා වෙනුවෙන් භාරකාර අරමුදලක්

(නිමල් කොතිඅවත්ත)

පාස්කු ඉරිදා ප්‍රහාර මාලාව හේතුවෙන් අසරණභාවයට පත්වූ ළමයින් 33 දෙනා රැක බලාගැනීමේ සහ ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ ස්ථිර වැඩපිළිවෙළ සඳහා භාරකාර අරමුදලක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය හිමිවී ඇති අතර ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් දැනටමත් රුපියල් කෝටි 10ක ප්‍රතිපාදන වෙන්කර ඇතැයි අග්‍රාමාත්‍ය කාර්යාලය පවසයි.

මෙම අරමුදල සඳහා රුපියල් කෝටි 30ක් බාහිර ප්‍රදාන මගින් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර හානි පූර්ණ කාර්යාලය හරහා ද අවශ්‍යතාව අනුව ආධාර සපයනු ඇතැයි අග්‍රාමාත්‍ය කාර්යාලය කියයි.

මේ පිළිබඳව අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් නිකුත් කළ නිවේදනයේ මෙසේද සඳහන්ය.

## භාණ්ඩාගාරයෙන් දැනටමත් කෝටි 10 ක්

පාස්කු ඉරිදා ප්‍රහාර මාලාව හේතුවෙන් අසරණභාවයට පත් වූ ළමුන් 33 දෙනා රැක බලාගැනීමේ සහ ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ ස්ථිර වැඩපිළිවෙළක් වශයෙන් භාරකාර අරමුදලක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය හිමි වී ඇති අතර මේ සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් කෝටි 10ක ප්‍රතිපාදන දැනටමත් වෙන්කර ඇත.

එසේම, මේ අරමුදල සඳහා රුපියල් කෝටි 30ක මුදලක් බාහිර ප්‍රදාන මගින් ලබාගැනීමට අපේක්ෂිතය. මීට අමතරව හානි පූර්ණ කාර්යාලය හරහා ද මෙම ළමයින්ගේ අවශ්‍යතාව පරිදි ආධාර සලසනු ඇත.

මියගිය පුද්ගලයකු වෙනුවෙන් රුපියල් දස ලක්ෂයක සහ තුවාල ලැබූ පුද්ගලයකු වෙනුවෙන් රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව වන්දි මුදලක් ගෙවීමට ද හානියට පත් දේපළ සඳහා වන්දි මුදල් ගෙවීමට ද රජය කටයුතු කරමින් සිටී.

මේ වනවිට මියගිය පුද්ගලයින් 189 දෙනකු වෙනුවෙන් රුපියල් මිලියන 183ක වන්දි මුදලකුත්, තුවාල ලැබූ පුද්ගලයින් 403 දෙනකු වෙනුවෙන් රුපියල් මිලියන 53කට අධික වන්දි මුදලකුත් ගෙවා අවසන් කර ඇත.

ප්‍රහාර මාලාවෙන් අනතුරුව මිනුවන්ගොඩ, කුලියාපිටිය, හෙට්ටිපොල වැනි ප්‍රදේශ කිහිපයක ඇති වූ නොසන්සුන්කාරී වාතාවරණය හේතුවෙන් හානියට පත් දේපළ වෙනුවෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය ද මේ වනවිට ආරම්භ කර ඇත. සම්පූර්ණ හානිපූර්ණ වන්දිය ගෙවන තෙක් යළි ව්‍යාපාර ආරම්භ කිරීම පිණිස අත්තිකාරම් මුදලක් ගෙවීමට හානිපූර්ණ කාර්යාලයට උපදෙස් දී ඇත.

වන්දි ගෙවීම පිළිබඳව යම් ගැටලුවක් ඇත්නම් ඒ පිළිබඳව 0112-575803, 0112-575813, 0112-575826 යන දුරකතන අංක ඔස්සේ හෝ 0112-575815 යන ෆැක්ස් අංකය ඔස්සේ හෝ හානි පූර්ණය පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ ආනන්ද විජේපාල මහතාගෙන් විමසන ලෙස රජය මහජනතාවගෙන් ඉල්ලා සිටී.